අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
# කාර්ය සාධන වාර්තාව - 2015

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ - 07

# ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

## <u>දැක්ම</u>

සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා ජාතික උරුමය සංරක්ෂණය, ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය කිරීම

## <u>මෙහෙවර</u>

සංස්කෘතික හා ස්වභාවික උරුමයට අයත් සම්පත් විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ආරක්ෂා කිරීම හා මහජනතාවගේ ඇගයීම, අධ්‍යාපනය සහ රසාස්වාදය උදෙසා ඉදිරිපත් කිරීම.

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | - | 011-2695366 |
| ෆැක්ස් අංකය | - | 011-2692092 |
| පොදු දුරකථන අංකය | - | 011-2694767 |
| ඊමේල් ලිපිනය | - | nmdep@slt.lk |
| වෙබ් ලිපිනය | - | www.musuem.gov.lk |

# පටුන

පිටු අංකය


1. හැඳින්වීම 01

2. මූල්‍ය ප්‍රතිපාදන 02 - 03

3. ආයතනික කටයුතු 04 - 09

4. 2015 වර්ෂයේ කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්යයන් 09

5. කෞතුකාගාර නරඹන්නන් පිළිබඳ විස්තර 10

6. විවිධ විෂයානුබද්ධ අංශවල කටයුතු

6.(අ) සංස්කෘතික අංශය 11 - 16

6.(අ).1 මානවවංශ විද්‍යා අංශය

6.(අ).2 මානව විද්‍යා අංශය

6.(ආ) විද්‍යාත්මක අංශය 16 - 22

6.(ආ).1 උද්භිද විද්‍යා අංශය

6.(ආ).2 කීට විද්‍යා අංශය

6.(ආ).3 භූ විද්‍යා අංශය

6.(ආ).4 සත්ත්ව විද්‍යා අංශය

7. අධ්‍යාපන ප්‍රකාශන අංශය 22 - 24

8. ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය 24

9. ජාතික කෞතුකාගාර පුස්තකාලය 24

10. ඡායාරූප අංශය 25

11. සංරක්ෂණ අංශය 25 - 26

12. ප්‍රදර්ශන සැලසුම් අංශය 27

13. තොරතුරු තාක්ෂණ අංශය 27 - 28

14. කෞතුකාගාර කටයුතු 29 - 30

14.(අ) කොළඹ ජාතික කෞතුකාගාරය

14.(ආ) ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය

14.(ඇ) ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය

14.(ඈ) මහනුවර ජාතික කෞතුකාගාරය

14.(ඉ) ඕලන්ද කෞතුකාගාරය

14.(ඊ) රත්නපුර ජාතික කෞතුකාගාරය

14.(උ) අනුරාධපුර ජන කෞතුකාගාරය

14.(ඌ) ගාල්ල ජාතික කෞතුකාගාරය

14.(එ) නිදහස් අනුස්මරණ කෞතුකාගාරය

15. 2015 වර්ෂයේ ආදායම 31 - 32

16. ඡායාරූප 33

ඡායාරූපය - අංක 01 මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය - මැදිරි අංක - 02 (කලාව හා වාස්තු විද්‍යාව)

ඡායාරූපය - අංක 02 මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය - මැදිරි අංක - 04 (රුහුණේ පුරෝගාමී චරිත)

# 2015 වර්ෂය සඳහා ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂකගේ කාර්යය සාධන වාර්තාව

## (1). හැඳින්වීම

අංග සම්පූර්ණ කෞතුකාගාර සේවාවක් රටට ලබාදීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේය. මෙම අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාකිරීමේදී සාමාන්‍ය වශයෙන් කෞතුකාගාරයක් හා සම්බන්ධ නානාවිධ කාර්යය පථයන් අතරින් අප රටට වඩාත් උචිත වන්නා වූ කාර්යය පථයන් තෝරා ගැනීමට දෙපාර්තමේන්තුවට සිදුවේ. මෙම තෝරා ගැනීමට අදාළ වන ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය පිණිස ලබාගත හැකි විවිධ සම්පත් මෙන්ම රටේ අවශ්‍යතාවය ද සැලකීමට භාජනය කරනු ලැබේ.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රතිපත්ති ප්‍රධාන කොටම ක්‍රියාත්මක කරනු ලබන්නේ, සමස්තයක් වශයෙන් මුළු රටම නියෝජනය කෙරෙන රැස්කිරීම් සම්භාරයකින් සමන්විත වූ කොළඹ ජාතික කෞතුකාගාරය මඟිනි. මීට අමතරව කොළඹ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, රත්නපුර ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික සමුද්‍ර කෞතුකාගාරය, පිටකොටුවේ ඕලන්ද කෞතුකාගාරය, අනුරාධපුර ජන කෞතුකාගාරය, නිදහස් අනුස්මරණ කෞතුකාගාරය හා මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලබන අතර, එම ප්‍රදේශවලට ආවේණික සංස්කෘතික සහ ස්වභාවික විද්‍යා උරුමයන් ද විදහා දැක්වීම එකී කෞතුකාගාරවල කාර්යය භාරය වේ. එසේම ජංගම කෞතුකාගාර සේවය ද හේතුකොට ගෙන දෙපාර්තමේන්තුවේ සේවා පථය පුළුල් වී තිබේ. මේ අනුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සතු කාර්යයන් පහත දැක්වෙන පරිදි විශ්ලේෂණය කර දැක්විය හැකිය.

I. ප්‍රාග් ඉතිහාසය, මානවවංශ විද්‍යාව, මානව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කීට විද්‍යාව, භූ ගර්භ විද්‍යාව, උද්භිද විද්‍යාව හා පාෂාණධාතු විද්‍යාව යන විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ වන්නා වූ වස්තූන් සහ ආදර්ශ රැස්කිරීම, ලේඛනාරූඪ කිරීම සහ ආරක්ෂා කිරීම.

II. යථෝක්ත ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම.

III. විද්වතුන්ගේ මෙන්ම ආධුනිකයන්ගේ ද ප්‍රයෝජනය පිණිස, ස්පෝලියා සෙලනිකා නමැති පර්යේෂණ සංග්‍රහය සහ වෙනත් සඟරා සහ ඒක විෂයක සංග්‍රහයන් ප්‍රකාශයට පත් කිරීම.

IV. රටේ ඉතිහාසය, කලා ශිල්ප හා ස්වාභාවික විද්‍යාවන්ට ද අදාළ වන්නා වූ දැනුම ප්‍රචලිත කිරීම වස් දේශන, ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ ආදියෙන් සමන්විත අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## (2). මූල්‍ය ප්‍රතිපාදන

### (අ). පුනරාවර්තන වියදම්:

| | වෙන් කළ ප්‍රතිපාදන | 2015.12.31 දිනට වියදම | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය | රු.28,695,000 | රු.27,503,302 | 96% |
| කෞතුකාගාර අධ්‍යාපනය | රු.40,481,000 | රු.36,713,000 | 91% |
| කෞතුකාගාර සේවා | රු.92,260,000 | රු.85,636,921 | 93% |
| **එකතුව** | **රු.161,436,000** | **රු.149,853,805** | **93%** |

### (ආ). ප්‍රාග්ධන වියදම:

| | වෙන් කළ ප්‍රතිපාදන | 2015.12.31 දිනට වියදම | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය | රු.6,470,000 | රු.5,908,502 | 91% |
| කෞතුකාගාර අධ්‍යාපනය | රු.11,250,000 | රු.11,133,000 | 99% |
| කෞතුකාගාර සේවා | රු.130,140,000 | රු.101,349,216 | 78% |
| එකතුව (මූලධන වියදම්) | රු.147,860,000 | රු.118,391,280 | 80% |
| එකතුව | රු.309,296,000 | රු.268,245,085 | 87% |

### (ඇ). 2015 වර්ෂයේ කෞතුකාගාර දෙපාර්තමේන්තුවට මිලදී ගත් භාණ්ඩ:

- වැය ශීර්ෂ අංකය: 2102 - ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ:

| ව්‍යාපෘතිය | වියදම |
|---|---|
| සාමාන්‍ය පරිපාලනය | රු. 784,745.00 |
| කෞතුකාගාර අධ්‍යාපනය | රු. 799,431.00 |
| කෞතුකාගාර සේවා | රු. 4,199,999.84 |

- වැය ශීර්ෂ අංකය: 2103 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ:

| ව්‍යාපෘතිය | වියදම |
|---|---|
| සාමාන්‍ය පරිපාලනය | රු. 1,149,940.00 |
| කෞතුකාගාර අධ්‍යාපනය | රු. 194,865.00 |
| කෞතුකාගාර සේවා | රු. 914,936.36 |

**(ඈ). 2015 වසරේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ව්‍යාපෘති**

<table>
<tr><th></th><th>ව්‍යාපෘතිය</th><th>2015 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන(රු.මිලි )</th><th>2015.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය</th><th colspan="2">2015.12.31 දිනට භෞතික ප්‍රගතිය</th></tr>
<tr><td>01</td><td>කොළඹ ජාතික කෞතුකාගාරයේ සංරක්ෂණාමය අළුත්වැඩියාව</td><td>57.7</td><td>59%</td><td colspan="2">67%</td></tr>
<tr><td rowspan="2">02</td><td rowspan="2">ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ අස්ථික මැදිරිය ඉදිකිරීම</td><td rowspan="2">10</td><td rowspan="2">87%</td><td>ගොඩනැගිලි ඉදි කිරීම</td><td>100%</td></tr>
<tr><td>ප්‍රදර්ශන සැකසීම</td><td>60%</td></tr>
<tr><td>03</td><td>රත්නපුර ජාතික කෞතුකාගාරයේ ජෛව විවිධත්ව උද්‍යානය ඉදිකිරීම</td><td>6.5</td><td>99%</td><td colspan="2">100%</td></tr>
<tr><td>04</td><td>ප්‍රාදේශීය කෞතුකාගාර වැඩි දියුණු කිරීම</td><td>28</td><td>99%</td><td colspan="2">90%</td></tr>
<tr><td>05</td><td>මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය ඉදි කිරීම</td><td>13</td><td>94%</td><td colspan="2">100%</td></tr>
</table>

# (3). ආයතනික කටයුතු

(අ). ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 400 කි.

(ආ). ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අනුමත ශ්‍රේණි සංඛ්‍යාව හා දැනට සිටින කාර්ය මණ්ඩලය

| තනතුර | සේවය | වැටුප් කේතය | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් ** | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය - විශේෂ | SL 3 | 1 | 0 | 1 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ** | ශ්‍රී ලංකා පරිපාලන සේවය 1 | SL 1 | 1 | 0 | 1 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ** | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය 1 | SL 1 | 1 | 0 | 1 |
| ප්‍රධාන ගණකාධිකාරී ** | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය 1 | SL 1 | 1 | 0 | 1 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක ** | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය 1 | SL 1 | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ * | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය 1 | SL 1 | | 1 | |
| අධ්‍යක්ෂ (විද්‍යා) ** | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය 1 | SL 1 | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ (සංස්කෘතික )** | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය 1 | SL 1 | 1 | 0 | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය 111 / 11 | SL 1 | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (මානව වංශ විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය 111 / 11 | SL 1 | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (මානව විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය 111 / 11 | SL 1 | 1 | 0 | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (උද්භිද විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය 111 / 11 | SL 1 | 1 | 0 | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (සත්ත්ව විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය 111 / 11 | SL 1 | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (කීට විද්‍යා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය 111 / 11 | SL 1 | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ ( කෞතුකාගාර සේවා) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය 111 / 11 | SL 1 | 1 | 0 | 1 |
| ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය 111 / 11 | SL 1 | 1 | 1 | 0 |
| පරිපාලන නිලධාරී | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය (අධිපන්තිය) | MN 7 | 1 | 1 | 0 |
| පුස්තකාලයාධිපති | ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය (අධිපන්තිය) | MN 7 | 1 | 0 | 1 |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය 11 / 1 | MN 6 | 2 | 0 | 2 |

| | | | | | |
|---|---|---|---|---|---|
| කෞතුකාගාර අධිකාරී | දෙපාර්තමේන්තුගත | MN 4 | 5 | 5 | 0 |
| සම්ප්‍රදායික කලා සහකාර | දෙපාර්තමේන්තුගත | MN 4 | 1 | 1 | 0 |
| ප්‍රදර්ශන සැලසුම් නිලධාරී | දෙපාර්තමේන්තුගත | MN 4 | 1 | 0 | 1 |
| අයවැය සහකාර | ආශ්‍රිත සේවා 111 / 11 / 1 | MN 4 | 1 | 1 | 0 |
| සංරක්ෂණ නිලධාරී | ආශ්‍රිත සේවා 111 / 11 / 1 | MN 4 | 2 | 2 | 0 |
| මිලදී ගැනීම් නිලධාරී | ආශ්‍රිත සේවා 111 / 11 / 1 | MN 4 | 1 | 1 | 0 |
| පර්යේෂණ සහකාර | ආශ්‍රිත සේවා 111 / 11 / 1 | MN 4 | 8 | 8 | 0 |
| පර්යේෂණ සහකාර | දෙපාර්තමේන්තුගත | MN 4 | 6 | 1 | 5 |
| අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරී | ආශ්‍රිත සේවා | MN 4 | 18 | 17 | 1 |
| තොරතුරු තාක්ෂණ සහකාර | ආශ්‍රිත සේවා | MN 4 | 1 | 1 | 0 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය 3-111 / 11 / 1 | MT 1 | 1 | 0 | 1 |
| වැඩසටහන් සහකාර | ආශ්‍රිත සේවා 111 / 11 / 1 | MN 4 | 1 | 1 | 0 |
| සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා 111 / 11 / 1 | MN 4 | 2 | 2 | 0 |
| සංවර්ධන නිලධාරී | සංවර්ධන නිලධාරී සේවය 111 / 11 / 1 | MN 4 | 13 | 07 | 6 |
| සංවර්ධන නිලධාරී (දෙමළ) | සංවර්ධන නිලධාරී සේවය 111 / 11 / 1 | MN 4 | 7 | 0 | 7 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | දෙපාර්තමේන්තුගත | MN 4 | 1 | 0 | 1 |
| කෞතුකාගාර ආරක්ෂක | දෙපාර්තමේන්තුගත | MN 3 | 10 | 4 | 6 |
| කීට විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය 111 / 11 / 1 | MN 3 | 2 | 0 | 2 |
| උද්භිද විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය 111 / 11 / 1 | MN 3 | 1 | 0 | 1 |
| භූ විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය 111 / 11 / 1 | MN 3 | 1 | 1 | 0 |
| මානව විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය 111 / 11 / 1 | MN 3 | 1 | 0 | 1 |
| සත්ත්ව විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය 111 / 11 / 1 | MN 3 | 1 | 0 | 1 |
| සංරක්ෂණ සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය 111 / 11 / 1 | MN 3 | 1 | 0 | 1 |
| කාර්මික නිලධාරී | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය 111 / 11 / 1 | MN 3 | 2 | 0 | 2 |
| පුස්තකාලයාධිපති | රජයේ පුස්තකාලයාධිපති සේවය 111 / 11 / 1 | MN 3 | 4 | 2 | 2 |
| ඡායාරූප ශිල්පී | දෙපාර්තමේන්තුගත | MT 3 | 1 | 1 | |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය 111 / 11 / 1 | MN 2 | 20 | 12 | 8 |

| | | | | | |
|---|---|---|---|---|---|
| චර්ම ශිල්පී | දෙපාර්තමේන්තුගත | MN 1 | 1 | 1 | 0 |
| ආදර්ශ රූප කලාකරු | දෙපාර්තමේන්තුගත | MN 1 | 3 | 2 | 1 |
| ආරක්ෂක සහකාර | දෙපාර්තමේන්තුගත | MN 1 | 5 | 0 | 5 |
| කෞතුකාගාර පිළිගැනීමේ නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN 1 | 1 | 0 | 1 |
| රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය 111 / 11 / 1 | PL 3 | 8 | 5 | 3 |
| ලේඛන ප්‍රතිසංස්කාරක | දෙපාර්තමේන්තුගත | PL 2 | 9 | 7 | 2 |
| උද්‍යාන පාලක | දෙපාර්තමේන්තුගත | PL 2 | 2 | 1 | 1 |
| විදුලි කාර්මික | දෙපාර්තමේන්තුගත | PL 2 | 1 | 1 | 0 |
| වඩු කාර්මික | දෙපාර්තමේන්තුගත | PL 2 | 2 | 1 | 1 |
| පින්තාරුකරු | දෙපාර්තමේන්තුගත | PL 2 | 1 | 1 | 0 |
| පෙදරේරු | දෙපාර්තමේන්තුගත | PL 2 | 1 | 1 | 0 |
| ශ්‍රව්‍ය දෘශ්‍ය සහායක | දෙපාර්තමේන්තුගත | PL 2 | 1 | 1 | 0 |
| මුර පරීක්ෂක | දෙපාර්තමේන්තුගත | PL 1 | 1 | 1 | 0 |
| සහකාර මුර පරීක්ෂක | දෙපාර්තමේන්තුගත | PL 1 | 1 | 1 | 0 |
| කෞතුකාගාර මුරකරු | දෙපාර්තමේන්තුගත | PL 1 | 50 | 38 | 12 |
| පුස්තකාල සහායක | දෙපාර්තමේන්තුගත | PL 1 | 2 | 2 | 0 |
| කෞතුකාගාර සහායක | දෙපාර්තමේන්තුගත | PL 1 | 179 | 129 | 50 |

* නව කෞතුකාගාර පනත සම්මත වන තෙක් බලාත්මක වේ.

** දෙපාර්තමේන්තුව උත්ශ්‍රේණිගත කිරීම යටතේ අනුමත තනතුරුය. නව කෞතුකාගාර පනත සම්මත වන තෙක් බලාත්මක නොවේ.

**(ඇ). නව පත්වීම් ලැබූ පැමිණි නිලධාරීන්**

| **අනු අංකය** | **නම** | **තනතුර** | **දිනය** |
|---|---|---|---|
| 01 | පී.කේ.පී.ඩී. දයාරත්න මයා | රියදුරු III | 2015.02.16 |
| 02 | ඒ. බියට්‍රිස් මෙණවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2015.10.12 |
| 03 | ආර්.ඒ.ඒ. ප්‍රියංගනී මෙණවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2015.10.12 |
| 04 | ඩී.කේ.සී.ඉෂාරා මෙණවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2015.10.13 |

## (ඇ).2015 වර්ෂයේ උසස්වීම් ලද නිලධාරීන්

ප්‍රාථමික (ශිල්පීය නොවන) 1 ශ්‍රේණියට උසස් වීම.

| නම | තනතුර | උසස්වීම ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|
| ජෙනට් ශ්‍රියාණි මිය | පුස්තකාල සහායක | 2015.02.15 |
| ඒ. දයානන්ද මයා | මැදිරි භාරකරු | 2015.07.25 |

## (ඉ)2015 වර්ෂයේ අලුතින් ඇති කරන ලද තනතුරු

| තනතුර | අනුමත තනතුරු ගණන |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් ** | 01 |
| අතිරේක අධ්‍යක්ෂ  ජනරාල් ** | 02 |
| ප්‍රධාන ගණකාධිකාරී ** | 01 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක ** | 01 |
| අධ්‍යක්ෂ (විද්‍යා) ** | 01 |
| අධ්‍යක්ෂ (සංස්කෘතික )** | 01 |
| තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහකාර | 01 |
| කෞතුකාගාර ආරක්‍ෂක | 03 |
| රාජ්‍ය කළමණාකරණ සහකාර | 04 |
| ආරක්‍ෂක සහකාර | 02 |
| කෞතුකාගාර පිළිගැනීමේ නිලධාරී | 01 |
| රියදුරු | 01 |
| කෞතුකාගාර සහයක | 38 |

** දෙපාර්තමේන්තුව උත්ශ්‍රේණිගත කිරීම යටතේ අනුමත තනතුරුය. නව කෞතුකාගාර පනත සම්මත වන තෙක් බලාත්මක නොවේ.

## (ඊ). 2015 වසරේ විශ්‍රාම ලැබීම්

| අනු අංකය | නම | තනතුර | විශ්‍රාම ගිය දිනය |
|---|---|---|---|
| 01 | ටී.ඩබ්. පියදාස මයා | මානව විද්‍යා සහකාර | 2015.04.08 |
| 02 | කේ.පී.එස්. බණ්ඩාර මයා | මැදිරි භාරකරු | 2015.06.07 |
| 03 | එස්.එම්.එස්.කේ. සිල්වා මයා | මැදිරි භාරකරු | 2015.09.10 |
| 04 | කේ.එම්.ටී. බණ්ඩාර මයා | මැදිරි භාරකරු | 2015.10.13 |
| 05 | ඊ.ජී.ඩී. ගුණසේකර මයා | සංරක්ෂණ සහකාර | 2015.12.23 |

## (උ). ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 01 | ඩී.පී.එම්.එන්. සම්පත් මයා | රියදුරු III | 2015.03.16 |
| 02 | කේ. සිරිවර්ධන මෙණවිය | රාජ්‍ය කළමණාකරණ සහකාර III | 2015.07.06 |
| 03 | ආර්.එල්.ආර්. ජයසේකර මයා | ගණකාධිකාරී I | 2015.11.08 |

## (ඌ). ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 01 | ඊ.එච්.ඩී.ඩී. සුජීවා මිය | සංවර්ධන නිලධාරී III | 2015.05.22 |
| 02 | ටී.කේ.එම්.කේ. සමරසිංහ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2015.06.30 |
| 03 | වී.එස්.ඩී. අලුත්ගේ මිය | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය I | 2015.09.14 |
| 04 | ටී. චන්ද්‍රාදේවි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර I | 2015.09.14 |
| 05 | එච්. ගීතා රංජනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර I | 2015.10.12 |

(ඉ). විදේශිය සමුළු හා විදේශිය පුහුණු

| අනු අංකය | සහභාගි වූ අය | පැවති රට | දිනය | වැඩසටහන |
|---|---|---|---|---|
| 01 | සනුජා කස්තුරිආරච්චි<br>අධ්‍යක්ෂ (වැ.බ.) | සිංගප්පූරුව | 2015.11.25<br>2015.11.27 | ආසියාතික කෞතුකාගාර සංගමයේ සමුළුව |
| 02 | සනුජා කස්තුරිආරච්චි<br>අධ්‍යක්ෂ (වැ.බ.) | ප්‍රංශය | 2015.05.30<br>2015.06.04 | ජාත්‍යන්තර කෞතුකාගාර සම්මේලනය |
| 03 | එම්.ආර්.එම්.පී.එන්. ගුණතිලක මිය<br>සහකාර අධ්‍යක්ෂ (කීට විද්‍යා) | චීනය | 2015.04.12<br>2015.04.22 | Icom International Trainings Centre of Museum Studies |
| 04 | ටී.ඩී.එන්. ප්‍රනාන්දු මහතා<br>සහකාර අධ්‍යක්ෂ (පාලන) | චීනය | 2015.10.09<br>2015.10.31 | Seminar on public Administration for Civil Servants in Asian Counties |
| 05 | එන්.එම්. නෙත්තසිංහ මිය<br>සංරක්ෂණ නිලධාරී | ඉන්දියාව | 2015.08.05<br>2015.08.11 | Eight International Conference on the Inclusive Museum |
| 06 | ආර්.පී. මාධවිලතා මිය<br>අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරී | චීනය | 2015.06.07<br>2015.06.17 | Management of the Museum as a non profit organization |
| 07 | ඩබ්.ඩී. අබේසිංහ මයා<br>භූ විද්‍යා සහකාර | චීනය | 2015.06.07<br>2015.06.17 | Management of the Museum as a non profit organization |
| 08 | පී.එල්.වී.එච්.එස්. සේනාධීර මයා<br>විදුලි කාර්මික | චීනය | 2015.11.04<br>2015.11.27 | Maintenance of Facilities for Technicians of Sri lanka Art Theater in 2015 |

## (04). 2015 වර්ෂයේ කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්යයන්

- "රුහුණේ අභිමානය අනාගත පරපුර උදෙසා" යන්න අර්ථවත් කරමින් දකුණු පළාතට ආවේනික වූ ජාතික උරුමයන් පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින් මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය සියලු කාර්යයන් නිම කර 2015.05.08 වන දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අතින් ජනතා අයිතියට පවරන ලදී.
- "තිරසර සමාජයක් සඳහා කෞතුකාගාරය" යන මැයෙන් ජාත්‍යන්තර කෞතුකාගාර දින සැමරුම 2015 මැයි 18 වන දින වැලිඔය කිරිඉබ්බන්වැව විද්‍යාලයේදී පවත්වන ලදී.
- ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් පාදුක්ක ප්‍රදේශයේ ඉදි කළ ජාතික විදුලි සන්දේශ කෞතුකාගාරයේ සැලසුම් සඳහා උපදේශන සේවය ලබාදීම
- "ජනපති මැදුරෙහි අසිරිය පොදු ජන නෙතට විවර කිරීම" සඳහා ප්‍රදර්ශන ක්‍රමවේදයන් පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබාදීම

# (05). කෞතුකාගාර නරඹන්නන් පිළිබඳ විස්තර

2015 වර්ෂයේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන කෞතුකාගාර නැරඹීම සඳහා පැමිණි නරඹන්නන්ගේ සංඛ්‍යාව පහත පරිදි වේ.

| කෞතුකාගාරයේ නම | දේශීය | | විදේශීය | | පාසැල් | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැඩිහිටි | ළමා | වැඩිහිටි | ළමා | ගුරුවරු | ළමයි | නොමිළේ | එකතුව |
| කොළඹ ජාතික කෞතුකාගාරය | 52489 | 14650 | 39640 | 1476 | 8451 | 86697 | 1450 | 204853 |
| ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය | 10324 | 4064 | 2218 | 185 | 2322 | 27446 | 234 | 46793 |
| ඕලන්ද කෞතුකාගාරය | 4212 | 333 | 3149 | 153 | 49 | 773 | - | 8669 |
| රත්නපුර ජාතික කෞතුකාගාරය | 8308 | 2540 | 137 | 03 | 828 | 10593 | 60 | 22469 |
| මහනුවර ජාතික කෞතුකාගාරය | **සංරක්ෂණ නවීකරණ කටයුතු සඳහා තාවකාලිකව වසා ඇත.** | | | | | | | |
| ගාල්ල ජාතික කෞතුකාගාරය | 8792 | 2966 | 4722 | 236 | 1015 | 14199 | 534 | 32464 |
| සමුද්‍ර කෞතුකාගාරය | 11643 | 4342 | 3806 | 336 | 1371 | 19835 | - | 41333 |
| ජන කෞතුකාගාරය | 2609 | 821 | 178 | 02 | 458 | 1895 | 1296 | 7259 |
| නිදහස් අනුස්මරණ කෞතුකාගාරය | 11023 | 3503 | 459 | 29 | 789 | 8716 | 48 | 24567 |
| මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය | 945 | 232 | 18 | - | 43 | 633 | 125 | 1996 |
| **එකතුව** | 110345 | 33451 | 54327 | 2420 | 15326 | 170787 | 3747 | 390403 |

# (06). විවිධ විෂයානුබද්ධ අංශවල කටයුතු

## (අ). සංස්කෘතික අංශ

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සංස්කෘතික අංශය, මානව වංශ විද්‍යා හා මානව විද්‍යා යන අංශ දෙකෙන් සමන්විත වේ. එක් එක් අංශවලට අයත් භාණ්ඩ එක්රැස් කිරීම, ප්‍රදර්ශනය, ගබඩා කිරීම, සංරක්ෂණය, ලේඛනගත කිරීම, අධ්‍යයනය හා අධ්‍යාපනය ලබා දීම මෙම අංශය මගින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් වෙයි.

## (1). මානව වංශ විද්‍යා අංශය

### (අ). රැස්කිරීම් හා ලේඛනගත කිරීම්

මානව වංශ විද්‍යා අංශය විසින් මේ වසරේදී රැස්කර ගන්නා ලද භාණ්ඩ හා ලේඛනගත කිරීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | භාණ්ඩය | ලියා පදිංචි කළ අංකය | භාණ්ඩය ලබා දුන් අයගේ විස්තර හා දිනය | භාණ්ඩය ලබාගත් ක්‍රමවේදය |
|---|---|---|---|---|
| 01 | සටන් කඩුවක් | 2015.8.1 | එච්. ආර්. බණ්ඩාර<br>නො. 235,<br>කොළඹ පාර, වඳුරාගල,<br>කුරුණෑගල<br>2015ග06ග2015 | පරිත්‍යාග |
| 02 | සිරියානු බැංකු නෝට්ටු 05ක ආදර්ශ නිකුතු | 2015.11.1<br>2015.11.2<br>2015.11.3<br>2015.11.4<br>2015.11.5 | Dr. Adib mayaleh,<br>Governof syrian republic ,<br>Central Bank of syria,<br>Damascus.<br>2015.08.31 | පරිත්‍යාග |
| 03 | නිදහස් අනුස්මරණ කාසිය | 2015.12.1 | එස්.ඩබ්. ජයසේන<br>"සචිනි ස්ටෝර්ස්",<br>ගොඩිගමුව පාර,<br>දූනගහ<br>2015.09.30 | මිලදී ගැනීම<br>(Rs.10000.00) |
| 04 | හතරවෙනි එඩ්වර්ඩ් රජු සහ ඇලෙක්සැන්ඩ්‍රා බිසවගේ ඔටුනු පැළඳීම අනුසුමරණය කෙරෙන කාසිය | 2015.13.1 | | |

### (ආ). පර්යේෂණ

මානවවංශවිද්‍යා අංශය විසින් මේ වසරේදී කරන  ලද පර්යේෂණ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

1. කෞතුක භාණ්ඩ එකතූන් පිළිබඳ පර්යේෂණ කොට ප්‍රකාශන එළි දැක්වීම, නාමාවලි සකස් කිරීම හා පර්යේෂණ පත්‍රිකා එළි දැක්වීම.

2. මහවැලි අමාත්‍යංශය මඟින් එළි දැක්වීමට නියමිත ලංකාවේ වාරි ඉතිහාසය නම් පර්යේෂණ ග්‍රන්ථය සඳහා "සංක්‍රාන්ති අංශයේ වාරි කටයුතු" යන මැයෙන් පර්යේෂණ ලිපියක් ඉදිරිපත් කිරීම.

3. ආචාර්ය පී.එච්.ඩී.එච් ද සිල්වා මහතා සමඟ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කෞතුකාගාර වල හා අනෙකුත් කෞතුකාගාර වල ඇති හුණු කිල්ලෝට හා විවිධ අවශ්‍යතා වලට භාවිතා කරන ලද මංජුසා පිළිබඳ කරන ලද අධ්‍යනයක ප්‍රතිඵලයක් ලෙස ''Killota or Chuim (cime) boxes in Sri Lankan Museums" හා " Dtuch  and other foreign tobacco boxes in the Sri Lankan Museums" ග්‍රන්ථය සම්පාදනය කිරීම.

### (ඇ). ප්‍රදර්ශන

මානවවංශ විද්‍යා අංශය මඟින් මේ වසරේදී ජංගම ප්‍රදර්ශන 10 ක් පවත්වන ලදී.

### (ඈ). බාහිර සේවා

- විශ්වවිද්‍යාල සිසුන් සියයකගේ හා වෙනත් පර්යේෂකයින් 25 දෙනෙකුගේ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය දත්ත හා උපදේශන සේවා ලබා දීම
- කැළණිය විශ්ව විද්‍යාලයේ ඉතිහාසය අවසන් වසර ශිෂ්‍ය ශිෂ්‍යාවන් දස දෙනෙකුගෙන් යුත් කණ්ඩායමකට දින 10 ක කෞතුකාගාර විද්‍යාව පිළිබඳ පාඨමාලාවක් පැවැත්වීම

## (2). මානව විද්‍යා අංශය

### (අ). රැස් කිරීම්, හඳුනා ගැනීම් හා ලේඛනගත කිරීම්

| අනු අංකය | භාණ්ඩය | අත්පත් කරගත් දිනය | අත්පත් කරගත් ආකාරය | ලියාපදිංචි අංකය | ලියාපදිංචි කල දිනය | අත්පත් කරගත් ප්‍රදේශය |
|---|---|---|---|---|---|---|
| 01 | තඹ ලෝහය මිශ්‍රිත තාච්චිය | 2015.04.28 | පරිත්‍යාග | 2015.1.1 | 2015.05.22 | කොළඹ |
| 02 | තාලි 02 යි | 2015.05.26 | පරිත්‍යාග | 2015.2.1/ 2015.2.2 | 2015.06.22 | මාතර |
| 03 | බරණි 02 යි | 2015.05.26 | පරිත්‍යාග | 2015.3.1/ 2015.3.2 | 2015.06.22 | මාතර |
| 04 | නාග රාක්ෂ වෙස්මුහුණ | 2015.05.26 | පරිත්‍යාග | 2015.4.1 | 2015.06.22 | මාතර |
| 05 | වස්ති ලබාදෙන උපකරණය | 2015.05.26 | පරිත්‍යාග | 2015.5.1 | 2015.06.22 | මාතර |
| 06 | බෙහෙත් කොටන වංගෙඩිය | 2015.05.26 | පරිත්‍යාග | 2015.6.1 | 2015.06.22 | මාතර |
| 07 | බෙහෙත් මංජුසාව | 2015.05.26 | පරිත්‍යාග | 2015.7.1 | 2015.06.22 | මාතර |
| 08 | ගිරයක් | 2015.06.12 | පරිත්‍යාග | 2015.9.1 | 2015.07.13 | කුරුණෑගල |
| 09 | කුරහන් ගල | 2015.06.12 | පරිත්‍යාග | 2015.10.1 | 2015.07.13 | කුරුණෑගල |
| 10 | ගෙජ්ජි කුට්ටම් 2 යි | 2015.09.10 | පරිත්‍යාග | 2015.22.1/2015.22.2 | 2015.11.09 | මාතර |
| 11 | හත් අඩිය ශාන්ති කර්ම සඳහා අඳින හැට්ටය | 2015.09.10 | පරිත්‍යාග | 2015.23.1 | 2015.11.09 | මාතර |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 12 | තොවිලය ආරම්භයේ අඳින ඇඳුමේ කොටස් 04 යි | 2015.09.10 | පරිත්‍යාග | 2015.24.1/2015.24.2 2015.24.3/2015.24.4 | 2015.11.09 | මාතර |
| 13 | සීලම්බු කුට්ටම | 2015.09.10 | පරිත්‍යාග | 2015.25.1 /2015.25.2 | 2015.11.09 | මාතර |
| 14 | පාද පටි 02 යි | 2015.09.10 | පරිත්‍යාග | 2015.26.1 /2015.26.2 | 2015.11.09 | මාතර |
| 15 | ශාන්ති කර්ම සඳහා භාවිතා කළ ඇඳුම් කට්ටලය | 2015.09.10 | පරිත්‍යාග | ලේඛනගත කිරීම සඳහා භාරදී ඇත | ලියාපදිංචිය සඳහා භාරදී ඇත | මාතර |
| 16 | ගිගිරි වළලු 02 යි | 2015.09.10 | පරිත්‍යාග | ලේඛනගත කිරීම සඳහා භාරදී ඇත | ලියාපදිංචිය සඳහා භාරදී ඇත | මාතර |
| 17 | තාන්ගුල් තොප්පිය | 2015.09.10 | පරිත්‍යාග | ලේඛනගත කිරීම සඳහා භාරදී ඇත | ලියාපදිංචිය සඳහා භාරදී ඇත | මාතර |
| 18 | ශුද්ධ මාත්‍ර ඇඳුම් කට්ටලය | 2015.09.10 | පරිත්‍යාග | ලේඛනගත කිරීම සඳහා භාරදී ඇත | ලියාපදිංදචිය සඳහා භාරදී ඇත | මාතර |
| 19 | මුහුණු වාපනය | 2015.09.10 | පරිත්‍යාග | ලේඛනගත කිරීම සඳහා භාරදී ඇත | ලියාපදිංචිය සඳහා භාරදී ඇත | මාතර |
| 20 | රෙදි ඉන හැඩ 03 යි | 2015.09.10 | පරිත්‍යාග | ලේඛනගත කිරීම සඳහා භාරදී ඇත | ලියාපදිංචිය සඳහා භාරදී ඇත | මාතර |
| 21 | මුතු ඉන හැඩ 03 යි | 2015.09.10 | පරිත්‍යාග | ලේඛනගත කිරීම සඳහා භාරදී ඇත | ලියාපදිංචිය සඳහා භාරදී ඇත | මාතර |
| 22 | පිත්තල කර්මාන්තයට භාවිතා කරන කෝව 02 යි | 2015.09.03 | පරිත්‍යාග | ලේඛනගත කිරීම සඳහා භාරදී ඇත | ලියාපදිංචිය සඳහා භාරදී ඇත | මහනුවර |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 23 | පිත්තල භාණ්ඩ පොලිෂ් කරන රෝද 05 යි | 2015.09.03 | පරිත්‍යාග | ලේඛනගත කිරීම සඳහා භාරදී ඇත | ලියාපදිංචිය සඳහා භාරදී ඇත | මහනුවර |
| 24 | පිත්තල කර්මාන්තයට භාවිතා කරන ඇමරි රෝදයක් | 2015.09.03 | පරිත්‍යාග | ලේඛනගත කිරීම සඳහා භාරදී ඇත | ලියාපදිචිය සඳහා භාරදී ඇත | මහනුවර |
| 25 | ට්‍රන්කා පෙට්ටිය | 2015.12.08 | පරිත්‍යාග | ලේඛනගත කිරීම සඳහා භාරදී ඇත | ලියාපදිංචිය සඳහා භාරදී ඇත | ගම්පහ |
| 26 | තාච්චිය | 2015.12.08 | පරිත්‍යාග | ලේඛනගත කිරීම සඳහා භාරදී ඇත | ලියාපදිංචිය සඳහා භාරදී ඇත | ගම්පහ |

**(ආ). පර්යේෂණ**

තාක්ෂණික ගෝලීයකරණය හමුවේ අභියෝගයන්ට ලක්වී ඇති කර්මාන්ත පිළිබඳ තොරතුරු සෙවීමේ අරමුණින් පිත්තල කර්මාන්තය පවත්වාගෙන යනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳ සිදුකරන ලද ''තාක්ෂණික ගෝලීයකරණය හමුවේ ශ්‍රී ලංකාවේ පිත්තල කර්මාන්තය'' යන පර්යේෂණය.

**(ආ). ක්ෂේත්‍ර චාරිකා**

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සහ යටිනුවර ප්‍රදේශීය ලේකම් කාර්යාලවලට අයත් ගම්මාන කිහිපයක පිත්තල කර්මාන්තය පිළිබඳව සිදුකරන ලද ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව.

**(ඇ). ජංගම ප්‍රදර්ශන**

| අනු අංකය | ප්‍රදර්ශනයේ නම | ප්‍රදර්ශනය සිදු කල කාලසීමාව | ප්‍රදර්ශනය පැවැත්වූ ස්ථානය |
|---|---|---|---|
| 01 | වෙස්මුහුණු ප්‍රදර්ශනය | 2015.04.01 සිට 2015.04.04 දක්වා | ර/බලංගොඩ ආනන්ද මෛත්‍රිය ම.ම. විදුහල් තාක්ෂණික හා අධ්‍යාපන ප්‍රදර්ශනය |
| 02 | වෙස්මුහුණු ප්‍රදර්ශනය | 2015.09.09 සිට 2015.09.12 දක්වා | උතුරු මැද පළාත් සභා භූමියේ පැවති කලා උළෙල - 2015 |

**(ඇ). බාහිර සේවා**

- දේශීය හා විදේශීය රටවලින් අධ්‍යයන කටයුතු සඳහා පැමිණෙන විද්‍යාර්ථයන්ට හා විශ්ව විද්‍යාල, පාසැල් සිසුන්ට අවශ්‍ය තොරතුරු ලබා දීම.

**(ඉ). වෙනත් කටයුතු**

- මානව විද්‍යා කෞතුක භාණ්ඩ එකතුවෙන් භාණ්ඩ 441 ක් ඡායාරූප ද සමග තොරතුරු පද්ධතියක් සකස් කිරීම
- මානව විද්‍යා අංශයේ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම

## (ආ). විද්‍යාත්මක අංශ.

උද්භිද විද්‍යා, කීට විද්‍යා, භූ විද්‍යා, සත්ත්ව විද්‍යා යන අංශ මෙයට අයත් වේ. ඒ ඒ අංශවලට අයත් භාණ්ඩ හා ආදර්ශක රැස්කිරීම, නඩත්තු කිරීම, ප්‍රදර්ශනය, එම භාණ්ඩ හා ආදර්ශක පිළිබඳ පර්යේෂණ කරන්නා වු බාහිර විද්වතුන්ට සහයෝගය ලබාදීම හා ජනතාව දැනුවත් කිරීමේ කටයුතු මෙම අංශ මගින් කෙරෙන ප්‍රධාන කාර්යයන් වෙයි.

## (1). උද්භිද විද්‍යා අංශය.

**(අ). අදාළ වර්ෂය තුළ සිදු කරන ලද රැස් කිරීම්, හඳුනා ගැනීම් හා ලේඛනගත කිරීම් -**

2015 දෙසැම්බර් 11 පුත්තලම (අරුවක්කාලු හොල්සිම් ආයතනය අවට) වියලි කලාපීය ශාක ආදර්ශක

| | | |
|---|---|---|
| *Aquilaria agallocha* | *Celosia argentea* | *Morinda coreia* |
| *Aristolochia indica* | *Frimbristylis spp.(family-cyperaceae)* | *Phoenix pusilla* |
| *Bauhinia racemosa* | *Ixora coccinea* | *Toddalia aculeate* |

(හඳුනා ගැනීම - සරත් ඒකනායක - IUCN)

**(ආ). ක්ෂේත්‍ර චාරිකා**

- ජූලි මස 29 ,30 දෙදින රත්නපුර ජාතික කෞතුකාගාරයේ ජෛව විවිධත්ව උද්‍යානයේ ඇති ශාක යාවත්කාලීන කිරීම.
- දෙසැම්බර් 11 පුත්තලම අරුවක්කාලු හොල්සිම් ආයතනය : වියළි කලාපීය ශාක ආදර්ශක රැස් කිරීම.

**(ඇ). ජංගම ප්‍රදර්ශන -**

- මැයි මස 18,19 , 20 තෙදින ජාත්‍යන්තර කෞතුකාගාර දිනය නිමිත්තෙන් වැලිඔය කිරිඉබ්බන් වැව විද්‍යාලයේ ජංගම ප්‍රදර්ශනය සඳහා උද්භිද විද්‍යා ප්‍රදර්ශන ඉදිරිපත් කිරීම.

**(ඈ). වැඩමුළු හා සම්මන්ත්‍රණ**

- 2015 වර්ෂයේ උද්භිද විද්‍යා අංශය විසින් අධ්‍යාපන හා ප්‍රකාශන අංශය සමඟ එක්ව වැඩමුළු හා සම්මන්ත්‍රණ 19ක් පවත්වා ඇත.

**(ඉ). වෙනත් කටයුතු**

- කෞතුකාගාර උද්‍යානයේ නඩත්තු කටයුතු/අධීක්ෂණ කටයුතු පිළිබඳ උපදෙස් අදාළ බාහිර ආයතනයට ලබා දීම.
- කොළඹ කෞතුකාගාර භූමියේ හරිතාගාරයක් ඉදිකිරීම.
- කොළඹ කෞතුකාගාර භූමි පරිශ්‍රයේ අවශ්‍ය ස්ථානවල අදාළ සංඥා පුවරු සවි කිරීම.
- ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ උද්භිද විද්‍යා මැදිරියේ ප්‍රදර්ශන පුවරු නවීකරණ කටයුතු.
- මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාර භූමියේ උද්‍යානය සකස් කිරීම් කටයුතු සඳහා උපදේශනය ලබා දීම.

## (2). කීට විද්‍යා අංශය

**(අ). අදාළ වර්ෂය තුළ සිදුකරන ලද රැස් කිරීම් හා ලේඛන ගත කිරීම්.**

- යාපනය විශ්ව විද්‍යාලයෙන් ලැබුණු කෘමි නිදර්ශක 06ක් ලියාපදිංචි කිරීම.

  *Erythrina gall wasp (Quadra stichus erythrinae)* -පිරිමි කෘමී 3 හා ගැහැණු කෘමි 3 යි

- පුත්තලම අරුවක්කාලු ප්‍රදේශයේ ක්ෂේත්‍ර චාරිකා මඟින් ගෝත්‍ර හතකට අයත් නිදර්ශක 103ක් රැස් කර ගන්නා ලදී.

  *Order -Hymenopetera*

  *Lepidoptera*

  *Othoptera*

  *Odonata*

  *Mantidae*

  *Hemoptera*

  *Coleoptera*

**(ආ). සංරක්ෂණය කරන ලද භාණ්ඩ හා ආදර්ශකවල විස්තර.**

ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ කීට විද්‍යා මැදිරිවල අඩංගු නිදර්ශක පිරිසිදු කිරීම සහ සංරක්ෂණය කිරීම. කෘමි එකතුව (පොල් පළිබෝධකයෝ, ගොයම් පළිබෝධකයෝ, පළතුරු පළිබෝධකයෝ, එළවළු පළිබෝධකයෝ)

**(ඇ). ජංගම ප්‍රදර්ශන.**

කීට විද්‍යා අංශය මගින් මෙම වසරේදී ජංගම ප්‍රදර්ශන 04 ක් පවත්වන ලදී.

**(ඈ). වැඩමුළු හා සම්මන්ත්‍රණ**

- 2015.01.12 හා 2015.03.02 යන දෙදින කැලණිය විශ්වවිද්‍යාලයේ සංචාරක හා සංස්කෘතික සම්පත් කළමණාකරණ උපාධි පාඨමාලාව හදාරන සිසුන් කිහිපදෙනෙකු සඳහා ප්‍රායෝගික පුහුණු ලබා දීම.

- 2015.08.27 දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සංචාරක හා සංස්කෘතික සම්පත් කළමණාකරණ උපාධි පාඨමාලාව හදාරන සිසුන් කිහිපදෙනෙකු සඳහා ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම.

- 2015.02.23 දින සිට 2015.03.06 දින දක්වා රුහුණු විශ්වවිද්‍යාලයේ සිසුන් කිහිපදෙනෙකු සඳහා කීට විද්‍යා නාමකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම.

- 2015.04.08 දින කැලණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හදාරන සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම.

(ඈ). බාහිර සේවා

- 2015.02.15 වන දින නාවල විවෘතවිශ්ව විද්‍යාලයේ ක්ෂණිකා ගුණසේකර ශිෂ්‍යාව සඳහා අවශ්‍ය පර්යේෂණ පහසුකම් සැපයීම.
- 2015.11.03 වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ අගස්ත්‍ය තොටගමුව ශිෂ්‍යයා සඳහා අවශ්‍ය පර්යේෂණ පහසුකම් සැපයීම.

## (3). භූ විද්‍යා අංශය.

### (අ). අදාළ වර්ෂය තුළ සිදුකරන ලද රැස් කිරීම්.

**මයෝසීන පොසිල එකතුව** - අරුවක්කාලු හොල්සිම් ආයතනය

### (ආ). ක්ෂේත්‍ර චාරිකා -

- භූ විද්‍යා ප්‍රදර්ශන මැදිරි නවීකරණයට අදාළව ප්‍රදර්ශන ආකෘති සෑදීමට අවශ්‍ය තොරතුරු හා පසුතල ඡායාරූප ගැනීමට 2015.05.11 දින රත්නපුර කුරුවිට ප්‍රදේශයේ ක්ෂේත්‍ර චාරිකාවක නිරත වීම.
- මයෝසීන පොසිල තැන්පතු නිරීක්ෂණය කිරීම හා අරුවක්කාලු හොල්සිම් ආයතනය විසින් රැස් කරන ලද මයෝසීන පොසිල කෞතුකාගාරයේ භූ විද්‍යා අංශයට භාර ගැනීම සඳහා 2015.12.11 වන දින අරුවක්කාලු හොල්සිම් ආයතනයට යාම.
- භූ විද්‍යා ප්‍රදර්ශන මැදිරි නවීකරණයට අදාළව ගාල්ල හියාරේ ප්‍රදේශයේ 2015.09.29 හා 30 දෙදින ක්ෂේත්‍ර චාරිකාවක නිරත වීම.

### (ඇ). ජංගම ප්‍රදර්ශන

භූ විද්‍යා අංශය මගින් මෙම වසරේදී ජංගම ප්‍රදර්ශන 03 ක් පවත්වන ලදී.

### (ඈ). ස්ථිර ප්‍රදර්ශන

භූ විද්‍යා ස්ථිර ප්‍රදර්ශන මැදිරි නවීකරණයට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

### (ඇ). බාහිර සේවා

- 2015 වර්ෂයේ භූ විද්‍යා අංශය විසින් භූ විද්‍යා ආදර්ශක සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් 04 දෙනෙකුට තොරතුරු හා සහයෝගය ලබා දීම.

# (4). සත්ත්ව විද්‍යා අංශය

### (අ). අදාළ වර්ෂය තුළ සිදුකරන ලද රැස් කිරීම්

- අධිකරණවලින් ගෙනෙන ලද සත්ත්ව ආදර්ශක සහ සත්ත්ව කොටස් හදුනා ගැනීම හා එම භාණ්ඩ බාර ගැනීම.
- යෝජිත අස්ථික මැදිරිය සදහා පිඹුරා, විල් මුවා, ගෝනා, ඩොල්ෆින්, පොළගා යන සත්ව නිදර්ශක රැගෙන ඒම.
- ජංගම ප්‍රදර්ශන සදහා විෂ සහිත සර්ප නිදර්ශක කොළඹ වෛද්‍ය විද්‍යාලයෙන් රැගෙන ඒම.

### (ආ). හඳුනාගැනීම් හා ලේඛනගත කිරීම්

- දිවයිනේ විවිධ ප්‍රදේශවල අධිකරණවලින් ගෙනෙන ලද සත්ත්ව ආදර්ශක සහ සත්ත්ව කොටස් හඳුනා ගැනීම හා රාජසන්තක කරන ලද භාණ්ඩ ලේඛන ගත කිරීම.
- ආචාර්ය කණිෂ්ක උකුවෙල මහතා ලබා දුන් මුහුදු සර්ප නිදර්ශක පර්යේෂණ ලේඛන ගත කිරීම.
- පර්යේෂක මෙන්ඩිස් වික්‍රමසිංහ මහතා විසින් භාර දුන් ගෙඹි නිදර්ශකය ලේඛන ගත කිරීම.
- ආචාර්ය මාධව මීගස්කුඹුර මහතා ලබා දුන් මත්ස්‍යය නිදර්ශක ලේඛන ගත කිරීම.

### (ඇ). සංරක්ෂණය කරන ලද භාණ්ඩ හා ආදර්ශකවල විස්තර

- සත්ත්ව විද්‍යා රසායනාගාරයේ ඇති තෙත් ආදර්ශක එකතුව සංරක්ෂණය කිරීම.
- සත්ත්ව විද්‍යා අංශය සතු WHT තෙත් ආදර්ශක එකතුව සංරක්ෂණය කිරීම.
- උරග නිදර්ශක එකතුව පිරිසිදු කර සංරක්ෂණය කිරීම.
- ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ සත්ව නිදර්ශක සංරක්ෂණය කර යාවත්කාලීන කීරීම.
- යෝජිත අස්ථි විද්‍යා මැදිරියට අවශ්‍ය හිපපොටේමස්, පිඹුරා, විල්මුවා , ගෝනා, ඩොල්ෆින්, කිඹුලා, යන සතුන්ගේ අස්ථි සැකිලි කිරීම.
- ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කර තිබූ නිල්තල්මසාගේ ඇට සැකිල්ල ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ අස්ථික මැදරීයේ ප්‍රදර්ශනය සඳහා සාදා නිම කිරීම.

### (ඉ). ක්ෂේත්‍ර චාරිකා

- යෝජිත අස්ථික විද්‍යා මැදිරියට අවශ්‍ය සත්ත්ව ආදර්ශක ගෙන ඒමට හියාරේ පිහිටි වනජීවී සංරක්ෂණ කාර්යාලයට යාම.

**(ඊ). ස්ථිර/තාවකාලික හා ජංගම ප්‍රදර්ශන**

2015 වසරේදී සත්ත්ව විද්‍යා අංශය විසින් ස්ථිර/තාවකාලික හා ජංගම ප්‍රදර්ශන 05ක් පවත්වන ලදී.

**(උ). වැඩමුළු හා සම්මන්ත්‍රණ**

- කොළඹ විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජීව විද්‍යා අංශයේ සිසුන් සඳහා පර්යේෂණ වැඩ මුළු පැවැත්වීම.

**(ඌ). බාහිර සේවා**

- විශ්වවිද්‍යාල ශිෂ්‍ය එල් . එම් විජේසුන්දර ශිෂ්‍යාවට මිරිදිය මත්ස්‍ය එකතුව අධ්‍යයනය සඳහා පහසුකම් ලබා දීම.
- පර්යේෂක සමීර කරුණාරත්න මහතාට WHT සත්ත්ව ආදර්ශක එකතුව අධ්‍යයනය සඳහා පහසුකම් සලසා දීම.
- පර්යේෂක දුලාන් විදානපතිරණ මහතාට ඇටිකුකුළු සත්ත්ව ආදර්ශක එකතුව අධ්‍යයනය සඳහා පහසුකම් සලසා දීම.
- ආචාර්ය එන් පී එස් කුඹුරේගම මෙණවියට කුණකටු නිදර්ශක එකතුව අධ්‍යයනය සඳහා පහසසුකම් සලසා දීම.
- ආචාර්ය ඩිනසාඩි රහීම් මෙණවියට ගොඩබිම බෙලිකවච එකතුව අධ්‍යයනය සඳහා පහසුකම් සලසා දීම.

**(එ). වෙනත් කටයුතු**

- ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ සත්ත්ව විද්‍යා මැදිරියේ කටුස්සන්, හූනන් සහ සර්ප එකතුව යාවත්කාලීන කිරීම.
- චර්ම ශිල්පී අංශය මඟින් ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ සත්ත්ව ආදර්ශක යාවත්කාලීන කිරීම.
- ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ මුහුදු බෙලි කවච මැදිරිය යෝජිත භූ විද්‍යා මැදිරියේ සකස් කිරීම සඳහා ගැනීම හේතුවෙන් එහි තිබුනු බෙලි කවච ඉවත් කිරීම.
- WHT සත්ත්ව ආදර්ශක එකතුව බාහිර පර්යේෂකයෙක් ලවා හදුනාගැනීමේ කටයුතු කිරීම.

## (7). අධ්‍යාපන හා ප්‍රකාශන අංශය.

### (අ). අධ්‍යාපන සම්මන්ත්‍රණ, වැඩමුළු හා දේශන

අධ්‍යාපන හා ප්‍රකාශන අංශය මගින් මෙම වසරේදී පාසැල් 14 ක් සඳහා පහ වසර ශිෂ්‍යත්ව, ශ්‍රී ලංකාවේ ඉතිහාසය හා කලාශිල්ප පිළිබඳ අධ්‍යාපනික සම්මන්ත්‍රණ සංවිධානය කරන ලදී. ඒවා පහත පරිදි වේ.

**අධ්‍යාපනික සම්මන්ත්‍රණ**

| දිනය | ස්ථානය |
|---|---|
| 2015.05.19 | කිරිඉබ්බන්වැව මහ විද්‍යාලය - වැලිඔය |
| 2015.05.26 | ක්‍රිස්තුරාජ ජාතික පාසල - තුඩැල්ල |
| 2015.05.27 | ශාන්ත මරියා මහ විද්‍යාලය - ජා - ඇල |
| 2015.06.22 | සොරගුණේ මහ විද්‍යාලය - හල්දුම්මුල්ල |
| 2015.06.24 | වෑගොව්ව මහ විද්‍යාලය - මිනුවන්ගොඩ |
| 2015.06.25 | මහින්ද විද්‍යාලය - කොළඹ - 10 |
| 2015.07.02 | පිටියේගෙදර ප්‍රාථමික විද්‍යාලය - ගම්පහ |
| 2015.07.04 | කිරිඉබ්බන්වැව මහ විද්‍යාලය - වැලිඔය |
| 2015.07.05 | පදවි ජයන්ති මහා විද්‍යාලය - පදවි - ශ්‍රී පුර |
| 2015.07.07 | මූකලන්ගමුව බණ්ඩාරණායක විද්‍යාලය - සීදූව |
| 2015.07.09 | වළගම්බා මහ විද්‍යාලය - අළුතෑපොල |
| 2015.07.13 | මහවිල කණිෂ්ඨ විද්‍යාලය - පානදුර |
| 2015.07.14 | මාරපොල විද්‍යාලය - මාරපොල |
| 2015.07.16 | බෞද්ධ මහා විද්‍යාලය - නිට්ටඹුව |

**(ආ). කෞතුකාගාර ජංගම ප්‍රදර්ශන**

මෙම වසර තුළදී අධ්‍යාපන හා ප්‍රකාශන අංශය මගින් කෞතුකාගාර ජංගම ප්‍රදර්ශන 18 ක් සහ ජංගම පොත් ප්‍රදර්ශන 02 ක් පවත්වන ලදී.

**(ඇ). ප්‍රකාශන කටයුතු**

මෙම වසර තුළදී අධ්‍යාපන හා ප්‍රකාශන අංශය මගින් මුද්‍රණය කරන ලද ප්‍රකාශන පහත පරිදි වේ.

- කෞතුකාගාර 18 වන කලාපය
- A Guide To The Magampura Ruhunu Heritage Museum Hambantota
- මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරයේ අත්පත්‍රිකා (සිංහල,දෙමළ)
- මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරයේ ආරාධනා පත්‍ර
- ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂිකර්මය - (නැවත මුද්‍රණය)
- වර්ණ පින්තූරපත් 300,000 - (නැවත මුද්‍රණය)
- සාරාර්ථ සංග්‍රහය - (නැවත මුද්‍රණය)
- මහාවංසය ප්‍රථම භාගය - (නැවත මුද්‍රණය)
- මහාවංසය ද්විතීය භාගය - (නැවත මුද්‍රණය)
- 2014 ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව හා සංයුක්ත තැටිය මුද්‍රණය කිරීම

**(ඈ). වෙනත් කටයුතු**

- ජංගම කෞතුකාගාර බස්රථයේ පිටත පුවරු නවීකරණය කිරීම හා බස්රථයේ බඳ ස්ටිකර් යොදා සකස් කිරීම

## (8). ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය

ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය 2015 වසරේදී බාහිර ආයතන 23 ක් සඳහා කුලියට දෙන ලද අතර එයින් ලද ආදායම රු. 644 000.00 කි.

## (9). ජාතික කෞතුකාගාර පුස්තකාලය

### (අ). අත්කරගැනීම්

මෙම වසර තුළදී ජාතික කෞතුකාගාර පුස්තකාලයට අත්පත් කරගනු ලැබූ ග්‍රන්ථ, සඟරා හා අනෙකුත් ලේඛන ගණන 9335 කි.

### (ආ). පොත් බැඳීම්, සූක්ෂම සේයාපටල ගතකිරීම් හා ඡායා පිටපත්.

මෙම වසර තුළදී පුස්තකාලය මගින් පාඨකයින් සඳහා ඡායාපිටපත් 9559 ක් නිකුත් කරන ලදී.

### (ඇ). පාඨක සංඛ්‍යාව

මෙම වසර තුළදී ජාතික කෞතුකාගාර පුස්තකාලයේ ස්ථිර සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව 11 . සාමාජිකත්වය අළුත් කරගත් සංඛ්‍යාව 05. තාවකාලික සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව 29. සාමාජිකත්වය තාවකාලිකව දීර්ඝ කරගත් සංඛ්‍යාව 02 කි. මෙම වසර තුළදී ජාතික කෞතුකාගාර පුස්තකාලයට පැමිණි මුළු පාඨක සංඛ්‍යාව 3232 කි.

### (ඈ). ආදායම

මෙම වසර තුළදී ජාතික කෞතුකාගාර පුස්තකාලයේ මුළු ආදායම රුඃ 197488.00 කි.

## (10). ඡායාරූප අංශය.

ඡායාරූප අංශය මගින් මෙම වසරේදී,

- ඡායාරූප ගත කිරීම් - 10790 කි.
- සංයුක්ත තැටිවලට (CD) ඇතුළත් කරන ලද ඡායාරූප සංඛ්‍යාව - 10790 කි.
- පුස්තකාල ලේඛනවල ඡායාරූප නිකුත් කිරීම් - 541 කි.
- කෞතුක භාණ්ඩවලට අදාල ඡායාරූප නිකුත්කිරීම් - 180 කි
- දෙපාර්තමේන්තුවේ අංශවලට අදාල ඡායාරූප නිකුත් කිරීම් - 1487 කි.

## (11). සංරක්ෂණ අංශය

### (අ). 2015 වසරේ සංරක්ෂණය කරන ලද භාණ්ඩ

#### (01). පොත් සංරක්ෂණය

- පුස්තකාලය සතු පුස්කොල පොත් එකතුවෙන් පත්තිරු 100කට වඩා අධික, පුස්කොල පොත් 101ක් දුහුවිලි ඉවත් කර සංරක්ෂණය කිරීම හා සුදුසු ලෙස තැන්පත් කිරීම
- ඉපැරණි පොත් 5000 ක් ධූමායනය කිරීම
- ඉතාමත් දුර්වල තත්ත්වයේ පැවති ඉපැරණි පොත් 12 ක් සංරක්ෂණය තුලින් භාවිතයට සුදුසු පරිදි සකස්කිරීම
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ වෙනත් අංශවල පොත් හා ලේඛන 145 ක බැඳීම් කටයුතු

#### (02). දැව කෞතුක භාණ්ඩ සංරක්ෂණය

- ඕලන්ද කෞතුකාගාරයේ ජනේලයක් හා කෞතුක ගෘහ භාණ්ඩ 08 ක් සංරක්ෂණය කිරීම
- මානවවංශ විද්‍යා අංශයේ දැව කෞතුක භාණ්ඩ 02 ක් සංරක්ෂණය කිරීම
- මානව විද්‍යා අංශයේ දැව කෞතුක භාණ්ඩ 34 ක් සංරක්ෂණය කිරීම

#### (03). තඹ හා තඹ මිශ්‍ර ලෝහ කෞතුක භාණ්ඩ සංරක්ෂණය

- කාසි 656 ක් සංරක්ෂණය කිරීම
- වෙනත් කෞතුක භාණ්ඩ 15 ක් සංරක්ෂණය

#### (04). සිතියම්, සිතුවම් හා ඡායාරූප සංරක්ෂණය

- සිතුවම් 07
- කොළඹ කෞතුකාගාරයේ සිතුවම් මැදිරියේ ''දිඹුලාගල මාරාවීදියේ'' සිතුවම් 02 ක් සංරක්ෂණය කිරීම

#### (05). වෙනත් කෞතුක භාණ්ඩ සංරක්ෂණය

- හම්බන්තොට කෞතුකාගාරයේ භාණ්ඩ 202
- කොළඹ කෞතුකාගාරයේ ගල් කැටයම් මැදිරියේ ගල් කැටයම් 15
- මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් ගරුමුණි වලව්වේ ඇති රෙදි පිළි 25

(06). **කෞතුකාගාරවල කෘමි හා ශාක මර්දන කටයුතු**

- කොළඹ කෞතුකාගාරය ඇතුළු සියලුම ප්‍රාදේශීය කෞතුකාගාරවල වේයන් මර්දන කටයුතු
- ගොඩනැගිලි මත වර්ධනය වන ශාක මර්දන කටයුතු සිදු කිරීම.

(07). **වෙනත් කාර්යයන්**

- කෞතුක භාණ්ඩ මැදිරි හා ගබඩාවල ආලෝකය හා ආර්ද්‍රතාවය පිළිබඳ වාර්තා සැකසීම.
- මධ්‍යම සංස්කෘතික අරමුදල හා එක්ව කොළඹ කෞතුකාගාරයේ ගල් කැටයම් මැදිරියේ බුදු පිළිමවල තත්ව වාර්තාවක් සැකසීම.
- ජාතික ඉතිරි කිරීමේ බැංකු ප්‍රධාන ශාඛාවේ පොත් ධූමායන කටයුතු සහ භාණ්ඩ සංරක්ෂණය පිළිබඳ උපදෙස් ලබා දීම.
- ජේ.ආර් ජයවර්ධන කේන්ද්‍රයේ දැව පුටුවක් සංරක්ෂණය කිරීම සහ පාරිසරික තත්ත්වය පවත්වා ගැනීම පිළිබඳ උපදෙස් ලබා දීම.
- ටවර් හෝල් රගහල පදනම යටතේ ඇති රුක්මණී දේවී කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩ අධීක්ෂණ කටයුතු සහ එහි සිතුවම් එකතුව පිළිබඳ තත්ත්ව වාර්තාවක් ලබා දීම.
- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ඩේවිඩ් පේන්ටර් මහතාගේ සිතුවම් නිරීක්ෂණය කර වාර්තාවක් ලබා දීම.
- පොලිස් ක්ෂේත්‍ර මූලස්ථානයේ සංගීත අංශයේ කෞතුකාගාරයේ ලිපි ද්‍රව්‍ය ගබඩා කිරීම පිළිබඳ උපදෙස් ලබා දීම.

## (12). ප්‍රදර්ශන සැලසුම් අංශය

- රත්නපුර ජාතික කෞතුකාගාරට අවශ්‍ය මානව රූප නිර්මාණය කිරීම.
- වැදි භාණ්ඩ මැදිරියේ ඉතිරි කොටස් නවීකරණ කටයුතු සිදු කිරීම.
- කෘෂිකර්ම මැදිරියේ අඩුපාඩු සකස් කිරීම.
- භූ විද්‍යා මැදිරියට අවශ්‍ය ඡායාරූප ගැනීම සඳහා ගාල්ල හියාරේ රක්ෂිතයට හා රත්නපුරයට යාම.
- කෞතුකාගාර පුස්තකාලයට අවශ්‍ය අල්මාරි සැලසුම් ලබාදීම.
- උද්‍යානයට අවශ්‍ය සංඥා පුවරු සකස් කිරීම.
- අස්ථික මැදිරියේ තල්මසා වර්ණ ගැන්වීම.

- රත්නපුර ජාතික කෞතුකාගාරයට අවශ්‍ය ගල් ලෙන සෑදීම.
- ඕලන්ද කෞතුකාගාරයට අවශ්‍ය ටිකට් කවුන්ටරය නිර්මාණයට දායකත්වය ලබාදීම.
- භූ විද්‍යා මැදිරියේ සත්ත්ව රූප නිර්මාණ කටයුතු ආරම්භ කිරීම.
- චිත්‍ර මැදිරියේ නවීකරණ කටයුතු ආරම්භ කිරීම.

## (13). තොරතුරු තාක්ෂණ අංශය.

ප්‍රලේඛන අංශය මගින් මෙම වසරේදී පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය සඳහා නවතම පුවත්, කෞතුකාගාර චාරිකා, ශ්‍රවණාගාරය වෙන්කරවා ගැනීම, කාර්යය මණ්ඩල තොරතුරු, බඳවා ගැනීමේ පටිපාටි ආදිය අවශ්‍ය පරිදි යාවත්කාලීන කිරීම

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩල තොරතුරු ඇතුලත් දත්ත සංචිතයේ තනතුරු වලට බඳවා ගැනීම්, ස්ථාන මාරුවීම්, උසස්වීම් ආදිය යාවත්කාලීන කිරීම

- ඉහත 2 දත්ත සංචිතයෙන් අවශ්‍ය අවස්ථාවන්හිදී තොරතුරු අදාල පාර්ශවයන්ට ලබාදීම

- කීට විද්‍යා අංශයේ පරිත්‍යාග වශයෙන් අත්පත් කරගත් ආදර්ශක 7 ක් හා සත්ත්ව විද්‍යා අංශයේ පරිත්‍යාග වශයෙන් අත්පත් කරගත් ආදර්ශක 61 ක් ද, මහේස්ත්‍රාත් අධිකරණවලින් එවන ලද ආදර්ශක 3 ක් ද වශයෙන් ස්වභාවික විද්‍යා අංශයේ ආදර්ශක **71** ක් (2015.01.01.NH සිට 2015.19.02.NH දක්වා) ස්වභාවික විද්‍යා මධ්‍යම අත්පත් කරගැනීමේ ලේඛනයේ ලියාපදිංචි කිරීම

- මානවවංශ විද්‍යා අංශයේ පරිත්‍යාග වශයෙන් අත්පත් කරගත් කෞතුක භාණ්ඩ 6 ක් හා මිලට ගත් එක් කෞතුක භාණ්ඩයක් ද මානව විද්‍යා අංශයේ පරිත්‍යාග වශයෙන් අත්පත් කරගත් කෞතුක භාණ්ඩ 35 ක් ද වශයෙන් කලා අංශයේ කෞතුක භාණ්ඩ **42** ක් (ලියාපදිංචි අංක 2015.1.1 සිට 2015.26.2 දක්වා) කලා අංශයේ මධ්‍යම අත්පත් කරගැනීමේ ලේඛනයේ ලියාපදිංචි කිරීම

- ඉහත 4 හා 5 ට අදාල පරිත්‍යාග සඳහා සහතික පත්‍ර නිකුත් කිරීම

- දෙපාර්තමේන්තු පරිගණක නඩත්තුව හා වෛරස් ආවරණ මෘදුකාංගය සම්බන්ධ කටයුතු කළමනාකරණය කිරීම

## (14). කෞතුකාගාරවල කටයුතු:

### (අ). කොළඹ ජාතික කෞතුකාගාරය.

වර්ෂ 1877 දී මහජන ප්‍රදර්ශනයට විවෘත වූ කොළඹ කෞතුකාගාරයේ ඉදිරිපස කොටසේ සංරක්ෂණ කටයුතු සහ ප්‍රතිසංස්කරණ කටයුතු මෙම වසරේ දී ද සිදු කරගෙන යන ලදී. මීට අමතරව සිතුවම් ප්‍රදර්ශන මැදිරියේ අලුත්වැඩියා කටයුතු ද, කෞතුකාගාරයේ දොරටුවල ආරක්ෂාව සඳහා යකඩ දොරවල් සවි කිරීම ද, සාම්ප්‍රදායික අභිචාර මැදිරියේ ප්‍රදර්ශන කටයුතු සකස් කිරීම ද සිදු කරන ලදී. එසේම විශ්වවිද්‍යාල හා පාසල් සිසුන්ගේ ව්‍යාපෘති සඳහා තොරතුරු සැපයීම මගින් සහයෝගය ලබා දීම සිදුකරන ලදී.

සංස්කෘතික කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යංශයේ ගරු අමාත්‍ය නන්දිමිත්‍ර ඒකනායක මැතිතුමා හා අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශයේ ගරු අමාත්‍ය එස්.බී නාවින්න මැතිතුමා කොළඹ ජාතික කෞතුකාගාරයේ නිරීක්ෂණ කටයුතු සඳහා පැමිණෙන ලදී.

### (ආ). ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය.

ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය මගින් මෙම වසරේදී අධ්‍යාපනික සම්මන්ත්‍රණ, දේශන සහ වැඩමුළු 11 ක් පවත්වන ලදී. පාසැල් සිසුන්ගේ හා විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සදහාත් පර්යේෂකයින් සදහාත් තොරතුරු ලබාදීම සිදු කරන ලදී. ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ පැවති භූ විද්‍යා මැදිරිය නවීකරණය කිරීම, පහත මහලේ බිම් කොටසක් අස්ථික විද්‍යා මැදිරි ප්‍රදර්ශිත භූමි ප්‍රමාණය වැඩි කිරීම සඳහා ටයිල් කර අළුත්වැඩියා කිරීම, බිම් මහලේ දිරා ගිය ජනේල් ඉවත් කර ඇලුමිනියම් ජනේල් යෙදීම ආදී අළුත්වැඩියා කටයුතු සිදු කර ඇත. එමෙන්ම ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය තුළ පිහිටි භූ විද්‍යා අංශයේ කාර්යාලයට පිවිසීම සඳහා පඩිපෙළක් ඉදි කිරීම, 2013.04.29 දින ආරම්භ කරන ලද අස්ථික විද්‍යා මැදිරියේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු 2015.04.29 දින අවසන් කිරීමද, කෞතුකාගාර ගොඩනැගිල්ලට පිවිසීම පහසු කිරීම සඳහා ප්‍රදර්ශන නාම පුවරු සාදා නිම කිරීම ආදිය ද සිදු කර ඇත.

### (ඇ). ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය.

ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය මඟින් පාසැල් කණ්ඩායම් හා නරඹන්නන් සඳහා දේශන හැඳින්වීම් ඉදිරිපත් කිරීම හා පාසැල් සිසුන්ගේ හා විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සඳහා, අවශ්‍ය තොරතුරු ලබා දීම සිදුකරන ලදී.

### (ඈ). මහනුවර ජාතික කෞතුකාගාරය.

මහනුවර ජාතික කෞතුකාගාරයේ සංරක්ෂණමය අලුත්වැඩියා කටයුතු හේතුවෙන් මෙම වසරේදී මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත නොකරන ලදී.

ඒ අනුව 2014.09.20 දින ආරම්භ කරන ලද සංරක්ෂණමය අලුත්වැඩියා කටයුතු අතරින් මෙම වර්ෂය අවසන් වන විට වහලය අලුත්වැඩියාවෙන් 70% ක් පමණද බිත්ති සැකසීමෙන් 85%ක් පමණද බිම් සැකසීමෙන් 80% ක් පමණද වටපිල සැකසීමෙන් 50%ක් පමණද වැඩ අවසන් කර ඇත. එමෙන්ම කෞතුකාගාර ගොඩනැගිල්ලෙහි වේයන් මර්දනය සඳහා විශේෂ රසායනික ප්‍රතිකර්මයක් සිදු කරන ලදී.

එසේම කෞතුකාගාර ගොඩනැගිල්ලෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන අතරතුරදී හඳුනාගත් පැරණි ඉදිකිරීම් කොටස් පුරාවිද්‍යාත්මක න්‍යායන්ට අනුව සංරක්ෂණය කර, ඉදිරි පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සඳහා යොදාගැනීමේ හා ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් ප්‍රදර්ශනය කර ඇත.

### (ඍ). ඕලන්ද කෞතුකාගාරය

ඕලන්ද කෞතුකාගාරය මගින් මෙම වසරේදී පාසැල් සිසුන් හා විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සඳහා තොරතුරු ලබාදීම, දේශන පැවැත්වීම සහ සංචාරක මඟ පෙන්වන්නන් සදහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකර ඇත. ජුනි මස දී ඉතිහාසය විෂය ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මඟින් පටිගත කිරීමක් සිදු කරන ලදී. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන ලබාදී කෞතුකාගාර ගොඩනැගිල්ලේ බිත්ති අලුත් වැඩියා කර පින්තාරු කිරීම සිදු කර ඇත.

### (ඎ). රත්නපුර ජාතික කෞතුකාගාරය.

රත්නපුර ජාතික කෞතුකාගාරය මඟින් විශ්වවිද්‍යාල හා පාසැල් සිසුන්ගේ ව්‍යාපෘති සඳහාත්, පර්යේෂකයින් සදහාත් අවශ්‍ය තොරතුරු ලබා දීම සහ පාසැල් සිසුන් සඳහා දේශන, සම්මන්ත්‍රණ හා වැඩමුළු ද, ජංගම ප්‍රදර්ශන ද සිදු කර ඇත.

2015.07.03 වන දින මීඩියා ට්‍රැවල්ස් (N.H.K) රූපවාහිනී නාලිකාව සඳහා සිංහ දත (Lion tooth) පිළිබඳව අවශ්‍ය තොරතුරු හා ඡායාරූප ලබා දීම සිදුකරන ලදී.

සබරගමු පලාත් සභාවේ පලාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් කෞතුකාගාර භූමියේ ප්‍රධාන මාර්ග අලුත්වැඩියා කිරීම සිදුකරන ලදී. මීට අමතරව කෞතුකාගාර දෙපාර්තමේන්තුව මගින් කෞතුකාගාරය සතු සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම, කෞතුකාගාර භූමිය වටා ඇති පරිමිති වැට අලුත්වැඩියා කොට නිම කිරීම, සබරගමු පළාත තුළ වඳවී ගිය සත්ත්ව ආකෘති කෞතුකාගාර උද්‍යානය තුළ නිර්මාණය කිරීම මෙම වසරේ සිදුකර ඇත.

### (ඏ). අනුරාධපුර ජන කෞතුකාගාරය.

අනුරාධපුර ජන කෞතුකාගාරය මෙම වසරේදී පාසැල් සිසුන්ගේ ව්‍යාපෘති සදහා තොරතුරු ලබාදීම සහ නුවර කලාවියේ ගැමි ජීවිතය පිළිබඳ දේශන හා වැඩමුළු ද පවත්වා ඇත. එමෙන්ම අනුරාධපුර ජන කෞතුකාගාර කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු නිම කරන ලදී.

අනුරාධපුර ජන කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කර ඇති ගැමි ගේ අලුත්වැඩියා කිරීම, කෞතුකාගාර පරිමිත වැට ඉදිකිරීම, ඖෂධ උයන සකස් කිරීමේ පළමු අදියර අවසන් කිරීම මේ වසරේ සිදුකරන ලද අනෙකුත් කාර්යයන් වේ.

අනුරාධපුර මහ නගරසභාව විසින් කෞතුකාගාර උද්‍යානය සකස් කිරීම සඳහා පහසුකම් සැපයීම සිදුකරන ලදී. මීට අමතරව අනුරාධපුර ජන කෞතුකාගාරය විසින් සියලු දෙනාට සෙත් පතා පිරිත් පිංකමක් සංවිධානය කරන ලදී.

## (ඌ). ගාල්ල ජාතික කෞතුකාගාරය.

පාසැල් හා විශ්වවිද්‍යාල සිසුන් සඳහා දේශන පැවැත්වීමත්, පාසැල් සිසුන්ගේ ව්‍යාපෘති සදහා තොරතුරු ලබාදීමත්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීමත් සිදුකරන ලදී.

2015.07.01 වන දින ජාතික රූපවාහිනියේ විකාශය වූ ''වාසුළිය'' සඟරාමය වැඩසටහනෙහි අර්ධ අවශ්‍යතාවයක් සඳහා කෞතුකාගාරය පිළිබඳ රූපවාහිනී පටිගත කිරීම හා 2015.09.08 වන දින චීන ජ්‍යාත්‍යන්තර ගුවන් විදුලි සේවාව මඟින් ගාල්ල ජාතික කෞතුකාගාරයේ ශ්‍රී ලංකා - චීන සම්බන්ධතා මැදිරිය පිළිබඳ වාර්තා වැඩසටහනක් පටිගත කිරීම සිදු කරන ලදී.

කෞතුකාගාරයේ ප්‍රධාන දොරටු තුන සහ ජනෙල් හතර සඳහා යකඩ පට්ටම් සවි කොට ඉබි යතුරු යෙදීම, කෞතුකාගාර සඳහා රථගාලක් වෙන් කොට ඒ සඳහා නාම පුවරුවක් ස්ථාපිත කිරීම, කාර්යාල කාමරයේ ඉදිකිරීම් කටයුතු ඇරඹීම, ගාල්ල ජාතික කෞතුකාගාරයේ නාමපුවරුවක් මාර්ගයෙන් අනෙක් පස සවි කිරීම ආදිය ද සිදු කොට ඇත.

## (එ). නිදහස් අනුස්මරණ කෞතුකාගාරය.

නිදහස් අනුස්මරණ කෞතුකාගාරය මගින් පාසැල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති, සහ පර්යේෂකයින් සදහා අවශ්‍ය තොරතුරු ලබා දීම, දේශන පැවැත්වීම සිදු කරන ලදී. කෞතුකාගාරය තුළට පිරිසිදු වාතය ලබා ගැනීම සඳහා Inlet Fan, flexible Hose පද්ධති දෙකක් සවි කරන ලදී.

# (15). 2015 වසරේ ආදායම

| කෞතුකාගාරයේ නම | ප්‍රවේශපත්‍ර | ප්‍රකාශන | කැමරා බලපත්‍ර | ගොඩනැගිලි කුළිය | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| කොළඹ ජාතික කෞතුකාගාරය | 24,854,080.00 | 756,083.00 | 1,452,500.00 | 533,329.94 | 100,920.00 | **27,696,912.94** |
| ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය | 1,968,385.00 | 1,298.00 | 47,000.00 | - | 143,160.00 | **2,159,843.00** |
| ජාතික කෞතුකාගාර පුස්තකාලය | - | - | - | - | 197,488.00 | **197,488.00** |
| ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය | - | - | - | 644,000.00 | - | **644,000.00** |
| ඕලන්ද කෞතුකාගාරය | 1,712,570.00 | 2,694.00 | 102,950.00 | - | - | **1,818,214.00** |
| මහනුවර ජාතික කෞතුකාගාරය | **සංරක්ෂණ නවීකරණ කටයුතු සඳහා තාවකාලිකව වසා ඇත.** | | | | | |
| ගාල්ල ජාතික කෞතුකාගාරය | 1,743,720.00 | 83,771.00 | 57,250.00 | - | - | **1,884,741.00** |
| රත්නපුර ජාතික කෞතුකාගාරය | 298,495.00 | 118,670.00 | 28,750.00 | - | 7,000.00 | **452,915.00** |
| ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය | 1,588,220.00 | 2,915.00 | 86,250.00 | - | - | **1,677,385.00** |
| අනුරාධපුර ජන කෞතුකාගාරය | 130,435.00 | 66,110.00 | 3,750.00 | - | - | **200,295.00** |
| නිදහස් අනුස්මරණ කෞතුකාගාරය | 321,265.00 | 15,010.00 | 10,500.00 | - | - | **346,775.00** |
| මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය | 34,030.00 | 100.00 | - | - | - | **34,130.00** |
| **එකතුව** | **32,651,200.00** | **1,046,651.00** | **1,788,950.00** | **1,177,329.94** | **448,568.00** | 37,112,698.94 |

## 2015 වසරේ ආදායම, 2014 වසරේ ආදායම සමග සංසන්දනය කිරීම.

| වර්ෂය | ප්‍රවේශපත්‍ර | ප්‍රකාශන | කැමරා බලපත්‍ර | ගොඩනැගිලි කුළිය | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2015 | 32,651,200.00 | 1,046,651.00 | 1,788,950.00 | 1,177,329.94 | 448,568.00 | 37,112,698.94 |
| 2014 | 19,967,080.00 | 1,082,183.00 | 2,113,050.00 | 470,625.00 | 841,867.00 | 24,474,805.00 |

2015 වර්ෂයේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මුළු ආදායම රු. 37,112,698.94 ක් වන අතර, 2014 වර්ෂයේ සමස්ත ආදායම රු. 24,474,805.00 ක් වේ.




ප්‍රස්ථාර අංක 01 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම

සනුජා කස්තුරිආරච්චි.
ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ (වැ.බ)

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,
කොළඹ- 07.



**ඡායාරූපය - අංක 01**



**ඡායාරූපය - අංක 02**